රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක : 06/2008

මගේ අංකය :- ආ7/3/2/23-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය.
කොළඹ 07.

2008.08.14

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ**
**<u>එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2008.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 හි 03 සහ 04 ඡේද කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී ඡේදයන්හි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කර ගැනීම සඳහා වූ විවිධ නියෝජනයන් මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇත. ඒ අනුව පහත සඳහන් කරුණු පැහැදිලි කරනු ලැබේ.

03. රාජකාරි ගමන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා රාජකාරි කටයුතුවල නියුක්තවන්නා වූ සම්පූර්ණ කාලය හා දින ගණන අනුව ගෙවිය යුතුය.

04. යම් නිලධාරියකු විශේෂ රාජකාරි සඳහා සේවා ස්ථානයෙන් බැහැර ප්‍රදේශයන්හි සේවයේ නියුක්ත කරවීමට සිදුවන අවස්ථාවන්හිදී ඒ සඳහා අතිරේක ඉන්ධන සැපයිය යුතුය. අතිරේක ඉන්ධන සැපයුම අමාත්‍යාංශ ලේකම්/ පළාත් සභාවක ප්‍රධාන ලේකම් හෝ ඔවුන් විසින් බලය පවරන වෙනත් නිලධාරියකු විසින් හෝ අනුමත කළ යුතුය.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය